**<u>මාණ්ඩලික සටහන්පත</u>**

| යොමු කලේ: | <u>පුහුණු කපිතාන්ගේ අංශ පිරික්සුමේදී නිරීක්ෂණය වූ කරුණු</u> |
|---|---|

පුහුණු කපිතාන් (නාසාවි)

අණදෙන නිලධාරි (නාසාවි)

විධායක නිලධාරි (නාසාවි)

සියළුම පාසල් භාර නිලධාරින්

**<u>මාස – 1</u>**

**<u>අණභාර නිලධාරි අවි පාසල විසින්</u>**

1. 2017 පෙබරවාරි මස 20 වන දින නාවික හ සාගරික විද්‍යාපීඨයේ පවත්වනු ලැබූ අංශ පිරික්සුමේදි පුහුණු කපිතාන්තුමාගේ නිරීක්ෂණයට ලක් වූ කරුණු පහත සඳහන් පරිදි වේ.

අ. **<u>පුහුණු වන නිලධාරින්</u>**

**(1) <u>කණිෂ්ඨ නිලධාරි මාණ්ඩලික පාඨමාලාව</u>**

(අ) පංති නායක රපෝර්තු කිරීම, ආචාර ගමන, දුර්වල මට්ටමක තිබීම.
(ආ) සිරුවෙන් සිටීමේ ඉරියව්ව වැරදි බව.
(ඇ) ගාංචුව උඩු යටිකුරු කර පැලඳ සිටීම.

**(2) <u>19 වන උප ලුතිනන් තාක්ෂණික පාඨමාලාව (විධායක)</u>**

(අ) අංශභාර නිලධාරින්ගේ අසිපත්, බඳපටි බ්‍රාසෝ කර නැත.
(ආ) කොණ්ඩය නිසිලෙස කපා නොතිබීම
(ඇ) රපෝර්තු කිරීම, ආචාර ගමන, අණදීම දුර්වල මට්ටමක තිබීම.

**(3) <u>පුහුණු වන මධ්‍ය නිලධාරි සහ ශිෂ්‍යභට නිලධාරින්</u>**

(අ) පාද ජාලා හා බඳපටි වල බ්‍රාසෝ කොටස් නිසි ලෙස පිරිසිදු කර නොකිරීම. සහ බඳපටි වලට තීන්ත කලවම් කර අලේප කර තිබීම.
(ආ) අංක 5 නිල ඇඳුමේ තින්ත සහ පැල්ලම් තිබීම.
(ඇ) අංක 5 නිල ඇඳුමට සරිලන යට ඇඳුම ඇඳ නොපැමිණීම.
(ඈ) 58 වන බඳවා ගැනීමේ ශිෂ්‍යභට නිලධාරින්ගේ නිල ඇඳුම සහ අනෙකුත් උපාංග සුදුසු තත්වයේ නොතිබීම.
(ඉ) 59 වන බඳවා ගැනීමේ ශිෂ්‍යභට නිලධාරින්ගේ නිල ඇඳුම සහ අනෙකුත් උපාංග සුදුසු තත්වයේ නොතිබීම.
(ඊ) මධ්‍ය නිලධාරි ඩබ්ජීජී වටවන (එන්ආර්එක්ස් 3799 KDU32) වෛද්‍ය වරයෙකු වෙත යොමු කිරීමට අංශ භාර නිලධාරි වෙත උපදෙස් දෙන ලදි.

ආ. **<u>ජ්‍යෙෂ්ඨ නාවික අංශ</u>**

**(1) <u>ජ්‍යෙෂ්ඨ උපදේශක අංශය</u>**

(අ) කොණ්ඩය කපා නොතිබීම
(ආ) සපත්තු පොලිෂ් කර නොතිබීම.
(ඇ) ජ්‍යෙෂ්ඨ නාවික අංශයේ නාවිකයින්ට අංශ පිරික්සුමකදී භාවිතා කිරීමට වෙනම සුදු සපත්තු (D 59) යුගලක් තබා ගන්නා ලෙස උපදෙස් දෙන ලදි.

**(2) <u>වෙරළබඩ යාත්‍රා හැසිරීමේ ජ්‍යෙෂ්ඨ නාවික අංශය</u>**

(අ) කොණ්ඩය කපා නොතිබීම
(ආ) සපත්තු පොලිෂ් කර නොතිබීම.

ඇ. <u>කණිෂ්ඨ උපදේශක අංශය</u>

කොණ්ඩය නිවැරදිව කපා නොතිබීම

ඈ. <u>උසස් පුහුණු පාඨමාලා හදාරන නාවික අංශ</u>

(අ) පාද ජාලා, බඳපටි වල බ්‍රාසෝ කොටස් නිසි ලෙස පිරිසිදු කර නොතිබීම සහ බඳපටි වලට නිල් කවලම් කර ආලේප කර තිබීම.
(ආ) සපත්තු පොලිෂ් කර නොතිබීම.
(ඇ) අංශ පිරික්සුම සඳහා සුදුසු තත්වයෙන් නිලඇඳුම් නොතිබීම.
(ඈ) නායක නැවි සුදුසුකම් ලැබීමේ විදුලි හා ගුවන් විදුලි කාර්මික අංශයන් වලට අයත් නාවිකයින් සූදානම්ව පැමිණීමේදී සාමාන්‍ය හොඳ තත්වයෙන් පැමිණ සිටීම
(ඉ) කඹ සහ රුවල් පාඨමාලාවේ බලනැවි ඒඑම්එම්පී කුමාර එක්ස්එස් 48841 නාවිකයා සහ සුළු නිලධාරි සුදුසුකම් ලැබීමේ ඉංජිනේරු පාඨමාලාවේ නායක ඉංජිනේරු කාර්මික ජීඑම්එන්ඩී දිසානායක ඊඊ 37557 යන නාවිකයින් දෙදෙනා වෛද්‍ය වරයෙකු වෙත යොමු කිරීම සඳහා අංශභාර නිලධාරි හට උපදෙස් ලබා දෙන ලදී.
(ඊ) සුළු නිලධාරි සුදුසුකම් ලැබීම පාඨමාලාව ගබඩා සහකාර/ලිපිකරු අංශය නැවත පරීක්ෂාකර බලා ඒ පිළිබඳ නැවත දැනුම් දෙන ලෙස පාසලේ දෙවන අණභාර නිලධාරීට උපදෙස් දෙන ලදී.
(උ) නායක නැවි සුදුසුකම් ලැබීම විනයාරක්ෂන (බී) අංශයේ බලනැවි (විප) ඩීකේඑල්ඩී ප්‍රේමතිලක එක්ස්ආර් 103946 නාවිකයාගේ උසට සරිලන බර තිබේදැයි යන්න පරීක්ෂාකර බලන ලෙස දෙවන අණභාර නිලධාරීට උපදෙස් දෙන ලදී.
(ඌ) නායක නැවි සුදුසුකම් ලැබීම විනයාරක්ෂන (බී) අංශයේ නාවිකයින් දෙදෙනෙකුගේ රැවුල නිසි ලෙස පවත්වාගෙන නොයාම.

ඊ. <u>තුන්වන පාඨමාලා හදාරන නාවික අංශ</u>

(අ) සපත්තු පොලිෂ් කර නොතිබීම.
(ආ) පාද ජාලා බඳපටි බ්‍රාසෝ කොටස් පිරිසිදු කර නොතිබීම.
(ඇ) නිවැරදි ලෙස කොණ්ඩය කපා නොතිබීම
(ඈ) තුන්වන අදියර පාඨමාලාව හදාරන විදුලි හා ගුවන් විදුලි කාර්මික නාවිකයින් සූදානම්ව පැමිණ සිටීම අනෙකුත් නාවිකයින්ට වඩා හොඳ තත්වයේ පැවති බව.

2. ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අංශභාර නිලධාරින් සහ අංශභාර නාවිකයින් දැනුවත් කිරීමට පාසල් භාර අණභාර නිලධාරින් කටයුතු කළ යුතු බවට පුහුණු කපිතාන් දැනුම් දුන් අතර, ඉදිරියේදී විද්‍යාපීඨය තුල පැවැත්වෙන අංශ පිරික්සුම් වලදී තම පාසල් සහ දෙපාර්තමේන්තුවලින් පැමිණෙන පුහුණු වන නිලධාරින් නාවිකයින් ඉතා උසස් මට්ටමින් සහභාගී කර වීමට සියළුම අංශභාර උපදේශකයින්ගේ වගකීම බව පුහුණු කපිතාන් විසින් වැඩි දුරටත් දැනුම්දෙන ලදී.

3. නිසි කටයුතු සඳහා ඉදිරිපත් කෙරේ.

2017 පෙබරවාරි 20

ජේඑස්ඩී සිල්වා
ලුතිනන් කොමාණ්ඩර් (අවි)

SINHALA MINUTE SHEET